**පට්ඨානදේශනා මාලාව - 'වීථිවාර'**
**'මාර්ග ප්‍රත්‍යය' – 18.07.2019**

නමො තසස භගවතො අරහතො සම්මා සම්බුද්ධසස
නමො තසස භගවතො අරහතො සම්මා සම්බුද්ධසස
නමො තසස භගවතො අරහතො සම්මා සම්බුද්ධසස

තුන්ලෝකාග්‍ර වූ භාග්‍යවත් වූ අරිහත් වූ සර්වඥ සම්මා සම්බුදුරජාණන් වහන්සේට සියලුම සත්වයන්ගේ සිත දැක්කා වූ සියලුම සත්වයන්ගේ කය දැක්කා වූ සිතක් පහළ වීමේ හේතුව දැනගත්තා වූ කයක් පහළ වීමේ හේතුව දැනගත්තා වූ හිතක් නැතිවෙන විදිය අවබෝධකොට ගත්තා වූ කයත් රූපයත් නැතිවෙන ආකාරය අවබෝධකොට ගත්තා වූ තථාගත සම්මා සම්බුදුපියාණන් වහන්සේට සිතත් කයත් නැති රූපයත් නැති සංඥාවක් මොකක්වත් නැති ශාන්ත වූ ස්වභාවයක් තිබෙන බවට ධර්මඥානයෙන් අබෝධකොට ගත්තා වූ සොයාගත්තා වූ තථාගත සම්මා සම්බුදුපියාණන් වහන්සේට චිත්තයක් ක්‍රියාත්මක වෙන්නේ නැති රූපයක් ක්‍රියාත්මක වෙනේ නැති ශාන්ත වූ ස්ථානය සදාකාලික සැප ඇති නිර්වාණ ධාතුව සැනසෙන ස්ථානය හැටියට දුකක් නැති ස්ථානය හැටියට අවබෝධකොට ගත්තා වූ තථාගත සම්මා සම්බුදුපියාණන් වහන්සේට මම සිරසින් වැඳ නමස්කාර කරනවා, මාගේ නමස්කාරය වේවා!

ඒ තථාගත සම්මා සම්බුදුපියාණන් වහන්සේගේ සන්තානයේ පහළ වූ ඒ උතුම් ශාන්ත වූ නිර්වාණ ධාතුව එළිපෙහෙළි කළා වූ නිර්වාණ ධාතුවට යා ගන්න උදව් උපකාර කළා වූ අනන්ත අපරිමාණ ගුණ ඇති ධර්ම ස්කන්ධයට ධර්ම රත්නයට මම සිරසින් වැඳ නමස්කාර කරනවා, මාගේ නමස්කාරය වේවා!

ඒ උතුම් වූ ධර්ම මාර්ගයේ ගමන් කොට නිර්වාණ ධාතුවට සැපත් වූ සසර දුකෙන් මිදී ගියාවූ මිදී යන ආකාරය ලෝකයට පහදා දෙසන්නා වූ ඒ ධර්මය සුරක්ෂිත කරන්නා වූ සීල සමාධි ප්‍රඥාවන්ගෙන් අග්‍ර ස්ථානයට පත් වූ ශ්‍රාවක මහා සංඝ රත්නයට මම සිරසින් වැඳ නමස්කාර කරනවා, මාගේ නමස්කාරය වේවා!

බුද්ධ රත්නයේ ආනුභාව බලයෙන් ධර්ම රත්නයේ ආනුභාව බලයෙන් සංඝ රත්නයේ ආනුභාව බලයෙන් ශාන්ත වූ නිර්වාණ ධාතුවේ උතුම් වූ ගුණානුභාව බලයෙන් අදත් මේ පින්වතුන්ට අපි කියල දෙන්නා වූ ධර්ම කාණ්ඩය ඉතාමත්ම හොඳින් වැටහේවා! තේරුම් ගන්න ලැබේවා! අවබෝධ වේවා! ඒ සඳහා මානසික වශයෙන් කිසිම නීවරණ ධර්මයක් බාධකයක් හැටියට ඉදිරිපත් නොවේවා! සැම දෙනාටම චිත්ත ඒකාග්‍රතාවය පවත්වාගෙන මේ ධර්ම කාණ්ඩය හොඳට තේරුම් අරගෙන අවබෝධ කරගෙන එයම මනසිකාර ප්‍රතිපදාවක් මනසිකාර මාර්ගයක් කොටගෙන විදර්ශනාව මෝරවාගෙන සංසාර දුකෙන් මිදී හේතුඵල ධර්ම රාමුවෙන් මිදී සැම දෙනාටම අමාමහ නිවනින් සැනසෙන්න ලැබේවා කියලා මෛත්‍රීයෙන් ආශිර්වාද කරනවා, ප්‍රාර්ථනා කරනවා. එසේ ප්‍රාර්ථනා කරමින් අපි මේ පින්වතුන්ට අදට අපි හිතාගෙන තිබෙන ධර්ම කාණ්ඩය කියලා දෙනවා.

මම විශ්වාස කරන හැටියට මේ පිංවතුන් සියලුදෙනාම මීට කලින් මේ මාතෘකාව යටතේ යම් යම් අවස්ථාවලදි ධර්ම දේශනාවන් අසා තිබෙන නිසා පට්ඨාන දේශනාවට සම්බන්ධ කොටගෙන ධර්ම කරුණු හිතපු නිසා මෙනෙහි කරපු නිසා දැන ගත් නිසා අද මේ කියලා දෙන්නා වූ ධර්ම කොට්ඨාසය තේරුම් ගන්න පහසුවෙයි කියලා අපි හිතනවා. අද මම මේ පින්වතුන්ට කියලා දෙන්න බලාපොරොත්තු වෙන්නේ සූත්‍ර දේශනා වල බොහෝ සෙයින් කථා කරලා තිබෙන ධර්මයක්. ඒ තමයි **මාර්ග ප්‍රත්‍යය ධර්මය. 'මාර්ග'** කියන වචනය භාවිතා කරලා තිබෙනවා පිළිවෙත කියන එකට. 'මාර්ගය' 'පිළිවෙත' 'ගමන්මග' 'ප්‍රතිපදාව' යන මේ අර්ථය තමයි මේකේ තිබෙන්නේ. මාර්ගය කියන්නා වූ වචනයේ සමාන්‍ය සරල තේරුම ගත්තහම මාර්ග තිබෙන්නේ කෙනෙකුට තැනකින් තැනකට යන්න. අපි සාමාන්‍ය විදියට කියනවා මේ ගමේ ඉඳලා එහා ගමට පාරක් තිබෙනවා කියලා. මේ ගමේ ඉඳලා එහා ගමට මාර්ගයක් තිබෙන්නේ ඇයි? මාර්ගය තිබෙන්නේ මෙහා ගමේ ඉන්නා වූ මිනිසුන්ට එහා ගමට යන්න පහසුවක් හැටියටයි. ඒ මාර්ගය තිබෙන නිසා තමයි මේ ඉන්නා වූ අය එහා පැත්තට යන්නේ. තැනකින් තැනකට යන්න

තිබෙන්නා වූ දෙයට මාර්ගය කියලා කියනවා. තැනකින් තැනකට යන්න උපකාර වෙන දේට මාර්ගය කියලා කියනවා. තවත් එක්ක තමයි යම් පැත්තකට හෝ තැනකින් තැනකට හෝ උඩ යට හෝ කොහේ හෝ තැනකට යන එකකට කියනවා මාර්ගය කියලා. සරලව ගත්තොත් මෙහා ගමේ ඉන්නා වූ මනුස්සයාට එහා ගමට යන්න උදව්වෙන දේට උපකාර වෙන දේට කියනවා මාර්ගය කියලා. ඒවගේ යම්කිසි කෙනෙක් දුකක ඉන්නවා නම් ඒ දුක අත්හැරලා දාල දුකෙන් ඉවත්වෙලා සැපයකට යන්න තිබෙනවා නම් ඒකටත් කියනවා දුකේ ඉඳලා සැපයට යන මාර්ගය කියලා. එතකොට ඒක එක්තරා විදියක ක්‍රියා පටිපදාවක්, උපාය මාර්ගයක්. මෙන්න මේ අර්ථය තමයි මේකේ තිබෙන්නේ.

යම් කිසි ලෝකයට ඉඳලා තවත් ලෝකයකට යනවා නම් ඒකත් මාර්ගයක්. මනුස්සලෝකයේ ඉඳලා මනුස්සලෝකයටම යනවා නම් ඒකත් මාර්ගයක්. මනුස්සලෝකයේ ඉඳලා දිව්‍ය ලෝකයට යනවා නම් ඒකත් මාර්ගයක්. මනුස්සලෝකයෙන් බ්‍රහ්මලෝකයට යනවා නම් ඒකත් මාර්ගයක්. මේ ලෝක වලින් තවත් ලෝකවලට යන්න තිබෙන දේට කියනවා මාර්ග කියලා. නමුත් ඒ මාර්ග පොළෝ තලේ හදලා තිබෙන ගොඩ නගලා තිබෙන මාර්ග වාගේ නොවෙයි. පොළෝ තලය මත හදා තිබෙන මාර්ග තැනකින් තැනකට යන්න භූමි වශයෙන් උදව් වෙනවා උපකාර වෙනවා. ඒක පේනවා, දකින්න පුළුවන්. ඒ මාර්ගය වැටී ඇති තැනක් තිබෙනවා. මනුස්සලෝකයේ ඉඳලා දිව්‍යලෝකයට යනවා කියන මාර්ගය ඒ වගේ පෙන්නන්න භෞතික වශයෙන් පාරක් නෑ. ඒක තිබෙන්නේ ප්‍රතිපදාවකට එක්කාසු වෙලා. අපේ ජීවිතේ තිබෙන්නා වූ යම්කිසි ක්‍රියාවකට යම්කිසි වැඩ සටහනකට යම් කිසි පිළිවෙතකට එක්කාසු වෙලා මුල් වෙලා තමයි මේ කියන්නා වූ මනුස්ස ලෝකයේ සිට දිව්‍යලෝකයට යන මාර්ගය හැදී තිබෙන්නේ. ඒක පෙනුණේ නැතුවට ප්‍රතිපදාවක ක්‍රියා පටිපාටියකට එක්කාසු වෙනවා. බ්‍රහ්මලෝකයට යන මාර්ගයත් ඒ වගෙයි. මනුස්සලෝකයේ සිට කෙනෙක් බ්‍රහ්මලෝකයට යනවා නම් ඒකට යම්කිසි මාර්ගයක් ප්‍රතිපදාවක් පිළිවෙතක් අනුගමනය කළ යුතුයි. ඒවගේම තමයි යම්කිසි කෙනෙක් මනුස්සලෝකයේ ඉඳලා නිවනට යනවා නම් ඒ නිවන් පැත්තට යන්නා වූ ප්‍රතිපදාවට කියනවා මාර්ගය කියලා.

සැප පැත්තට යන්නා වූ මාර්ග තිබෙනවා. ඒවගේම තමයි සැපේ ඉඳන් දුකට යන්නා වූ මාර්ගත් තිබෙනවා. සරලව අපි තේරුම් ගන්න ඕනෑ මේ කියන්නා වූ මාර්ගයේ දුකට හෝ සැපට හෝ නිවනට හෝ කොහේ හෝ තැනකට යන ගතියක් තිබෙනවා. ප්‍රතිපදාවේ තිබෙනවා කෙනෙකුට මෙතැනින් අහකට යන්න උදව් කරන උපකාර වෙන පිහිට වෙන ස්වභාවයක්.

මේ ගමේ සිට එහා ගමට යන්න හදලා තිබෙන පාර ගත්තහම ඒක එහෙමම තිබෙනවා. ඒ පාර මොකක්වත් කරන්නේ නෑ. ඒ පාර ගෙදරට ඇවිල්ලා මනුස්සයාව එක්කාසු කරගෙන අඬගහගෙන යන්නේ නෑ. නමුත් මනුස්සයා ඒ පාර දැක්කහම පහසුවෙන් යන්න හිතෙන ඒ මනුස්සයා ඒ මාර්ගය දිගේ ගෙනියවන ගතියක් තිබෙනවා. මාර්ගයට මනුස්සයා වැටුනහම ඒ මාර්ගයේ යන මනුස්සයාට පහසුවෙන් යන්න, මාර්ගය වැටී තිබෙන ආකාරය පෙන්නුම් කරලා ඒ පැත්තට යවන්න, ඒ පැත්තට ඇදගෙන යන ගතියක් මේ මාර්ගයේ තිබෙනවා. ඕකට කියනවා මාර්ගයේ තිබෙන ප්‍රත්‍යය ශක්තිය කියලා.

අපි මේ මෑතකදී වනාන්තරයේ ඇවිදින්න ගියා. අපි සෑහෙන ඈතකට ගියා. කැලේ වනාන්තරයේ මැදට ගියාට පස්සේ කොහේ යනවද කියලා තේරුම් ගන්න බෑ. අපිට පාරවල් තුනක් තිබෙන ස්ථානයක් හම්බ උනා. එතැනින් දකුණු පැත්තට යන පාර දැක්ක ගමන්ම අපිට හිතක් පහළ උනා මේක තමයි හරි පැත්තට යනපාර කියලා. ඒ පාරේ ගියහම හරි ගියා. ඒ පාර වැටී තිබෙන විදියෙන් දැකපු ගමන්ම අපේ හිත ඒ පැත්තට අද්දවන ‘මේක තමයි නිවැරදි මාර්ගය, මේකේ යන්න ඕනෑ’ කියලා ඒ පාරට ඇද ගන්නා ගතියක් ඒ පාරේ තිබෙනවා. අපි ඒ පාරේ ගමන් කළා. ඒවගේම කිසි කරදරයක් නෑ, පාර තිබෙනවා යන්න පුළුවන් පහසුයි. ඊට පස්සේ අපි ආපසු එන තැනට එක්කාසු උනා.

ගමෙන් ගමට යන්න තිබෙන පාරත් ඒ වගෙයි. ඒ යන්නා වූ කෙනාට උදව් කරන උපකාර කරන අතරමං නොකරන වට්ටන්නේ නැති අසරණ කරන්නේ නැති ගතියක් ඒ මාර්ගයේ තිබෙනවා. ඒක අමුතු සැඟවිච්ච ගුණ ස්වභාවයක්. ඒ ගතිය අමුතුම විදියේ සැඟවිච්ච ඇතුලට කා වැදීලා තිබෙන ගුණ ස්වභාවයක්. ඒවගේ යම්කිසි කෙනෙකුට තැනකින් තැනකට යන්න, ධර්මයකින් ධර්මයකට යන්න, මේ ජීවිතියෙන් තව

ජීවිතියකට යන්න  මාර්ගයක් හැටියට ඉදිරිපත්වෙන, පිහිට වෙන, මාර්ගයක් හැටියට උදව් කරන, උපකාර කරන ශක්තියක් තිබෙන ධර්මතා ටිකක් තිබෙනවා. ඒවාට කියනවා මාර්ග හැටියට ඉදිරිපත් වෙලා උපකාරවෙන ධර්ම කියලා. ඒවාට තමයි කියන්නේ මාර්ග ධර්ම කියලා. ඒවාට මාර්ග ධර්ම කියලා කියන්න හේතුව ඒවා ඇතුලත තිබෙනවා  අපිට මැනලා තේරුම් ගන්න බැරි  කිරලා තේරුම් ගන්න බැරි අමුතුම විදියේ සැහවිච් ගුණ ගතියක්. ඒකට කියනවා මාර්ග ධර්ම වල තිබෙන **මාර්ග ප්‍රත්‍යය ගුණය, මාර්ග ප්‍රත්‍යය ශක්තිය, උපකාරවන ගුණය** කියලා. මම කිව්වා මේ පින්වතුන්ට අපි කැළේ අතරමං වෙච්ච වෙලාවේ එක පැත්තකට තිබ්ච්ච පාරේ  බැලූ බැල්මටම  තිබෙනවා 'මේකෙන් ගියහම හරි, මේකෙන් ගියහම වරදින්නේ නෑ' කියලා  අපේ  හිත අවුස්සන අපේ හිත ඒ පැත්තට අද්දලා ගන්න ඒ පාරේ ගියහම අපිව අසරණ කරන්නේ නැති අමුතු ගතියක්.  මේ කිව්වේ පොළොවේ මිනිස්සු  කපලා තිබෙන පාරක් ගැන උදාහරණයක් හැටියට.

නමුත් ඊටත් වඩා අමුතු පාරවල්  තිබෙන ගතිය  බුදුරජාණන්වහන්සේ දකිනවා, බුදුරජාණන්වහන්සේ දැන ගන්නවා අවබෝධ කරගන්නවා මේ සත්වයාගේ ජීවිතිය ඇතුලේ මතුකරගන්න පුළුවන් පාරවල් තිබෙන ධර්ම ටිකක් තිබෙනවා කියලා. ඒක නිසා වෙනත් කෙනෙකුගේ උදව්වෙන් උපකාරයෙන් වෙනත් කෙනෙකුගේ කරෙන් තවත් තැනකට යන්නේ නැතුව  වෙනත් තැනකට පමුණුවන ගුණ තිබෙන, ශක්තිය තිබෙන ධර්ම ටිකක් තමා තුලම  තිබෙන බව බුදුරජාණන්වහන්සේ දැක දැන අවබෝධ කරගෙන ඒ ටික දේශනා කරනවා, මෙන්න මේ ධර්ම වල තිබෙනවා තැනකින් තැනකට ගෙනියන පමුණුවන ධර්ම බලය ධර්ම ශක්තිය කියලා.  අන්න ඒ ටික තමයි **මාර්ග ධර්ම** කියලා හඳුනා ගන්නේ.

ඒවගේ මාර්ග ධර්ම පට්ඨාන විස්තර කථනයේ  එක්තරා  විදියකට පෙළ ගස්සලා තිබෙනවා. ඒ ටික තේරුම් ගත්තහම ඉස්සරහට යන්න පුළුවන්. මාර්ග වශයෙන් අපි කියන්නේ මාර්ග අංග 8යි. ඒක ආර්ය අෂ්ඨාංගික මාර්ගය කියලා දේශනා කරලා තිබෙනවා. නමුත්  මෙතැන මේ පට්ඨානය කියන එක සර්ව සංග්‍රහික දේශනාවක්. ඒ කියන්නේ සම්පූර්ණ මාර්ගය කියන ඔක්කෝම ටික අලලා දේශනා කරනවා. දැන් ඔය මාර්ග අංග කියන ධර්මවල  තිබෙන්නේ සුගතියට යන මාර්ගය විතරයි. අපේ සූත්‍ර දේශනා වල ආර්ය අෂ්ඨාංගික මාර්ගය කියලා තිබෙන්නේ සසර දුකින් මිදී යන්න උපකාරවෙන ධර්ම කොටස් අටට  විතරයි. එකේදි කියන්නේ නෑ ඒ මාර්ගයේ ගිහිල්ලා දුගතියට පත්වෙනවා කියලා. නමුත් පට්ඨාන අර්ථ කථාවේ විස්තර විග්‍රහයේ තිබෙනවා  මාර්ග ධර්ම ඔක්කොම ටික. අපායට යන ඒවයි තිරිසන් ලෝකයට යන ඒවයි දිව්‍යලෝක බ්‍රහ්මලෝක වලට යන ඒවයි නිවන් යන ඒවයි ඔක්කොම ටික එක මිටියට එක්කාසු කරලා එකමිටියට බැඳලා විස්තර කරනවා. අපි මේවා කොයි පැත්තට යන ඒවාද කියලා වෙනම තේරුම් ගන්න ඕනෑ. එතකොට ඔක්කොම මාර්ග අංග තිබෙනවා 12ක්. අපි මේ කථාව තේරුම් අරගෙන ඉස්සරහට යමු කොහොමද මේවා අපේ සිත්වල වැඩ කරන්නේ කියලා බලන්න.

අපි කිව්වා මාර්ග ධර්ම 12 ක් තිබෙනවා කියලා. ඒ මාර්ග ධර්ම  මෙහෙමයි කියවෙන්නේ. **සම්මා දිට්ඨි - සම්මා සංකප්ප - සම්මා වාචා - සම්මා කම්මන්ත - සම්මා ආජීව - සම්මා වායාම - සම්මා සතිය - සම්මා සමාධිය.** ඊළඟට ඔය අටට එක්කාසු කරන්න ඕනෑ **මිච්ඡා දිට්ඨි -  මිච්ඡා සංකප්ප - මිච්ඡා වායාම - මිච්ඡා සමාධි.** ඔය කියන්නා වූ  හතර එකතු කළාට පස්සේ 12 වෙනවා. මෙහිදී මිච්ඡා වශයෙන් එන්නේ හතරයි. හොඳ පැත්තට යනකොට සම්මා වශයෙන් ගත්තහම තමයි අනිත් ටික  තිබෙන්නේ. දැන් අපි බලන්න ඕන මේ ටික තිබෙන්නේ කොහේද කියලා.

දැන් අපි කරුණු කාරණා 12 ක් කියලා දුන්නා. මේ ටික අපි පැත්තකින් තියාගෙන තව පැත්තකට හැරෙමු. මේ පට්ඨාන අර්ථ විග්‍රහයෙන් අපිට විස්තර කරලා  දෙන්නේ කුමක්ද?  මෙහිදී ගොඩවල් හතරක් කියලා දෙනවා,  විස්තර කරලා දෙනවා. සිත්  89  ක් සහ  චිත්ත ගති  ස්වභාව 52 කියලා දෙනවා.  ඒවාට කියනවා චෛතසික කියලා.  ඊළඟට රූප,  ඕලාරික රූප සහ සියුම් රූප වශයෙන් කියලා දෙනවා 28ක්.  ඊළඟට නිර්වාණ ධාතුව. දැන් මෙතැන සියලුම  තිබෙනවා ධර්ම 170 ක්.

සිත් 89 + චෛතසික 52 + රූප ධර්ම 28 + නිර්වාණ ධාතුව (1)  = 170යි.

මේ ධර්ම 170 වම මාර්ගද? කියලා ප්‍රශ්නයක් අපිට හදන්න පුළුවන්. මේ ධර්ම 170 මාර්ග වෙන්නේ නෑ. මේ ධර්ම 170 වේම මාර්ග ගතිය නෑ. නිර්වාණය මාර්ගයක් වෙන්නේ නෑ. නිර්වාණය ධර්ම ස්වභාවයක්. එහෙනම් කොතැනද මේ කියන මාර්ග ධර්ම තිබෙන්නේ? සිත් ගොඩේද? චෛතසික ගොඩේද? රූප ගොඩේද? හොඳට බලන්න, මේ මාර්ග ධර්ම තිබෙන්නේ චෛතසික ධර්ම වලට එකතුවෙලා. චිත්ත ගතිවලයි තිබෙන්නේ. චිත්ත ගති වල තමයි ඔය හරඹ කරන්න පුළුවන් ගතිය තිබෙන්නේ. මේ පින්වතුන්ට මේ උදාහරණ කිව්වොත් තේරේවි.

වාහනයක් තිබෙනවා. ඒ වාහනේ තිබෙනවා මිනුස්සුන්ට ඉඳගෙන යන්න seat. වහලයක් තිබෙනවා. අනිත් හැමදේමත් තිබෙනවා. ඒකෙ රෝදත් තිබෙනවා. දැන් මේ වාහනය තැනකින් තැනකට යන්නේ seat නිසා නොවෙයි. වහලය නිසා නොවෙයි. Shutters නිසාත් නොවෙයි. වෙන මොකක්වත් නිසා නොවෙයි, මේ වාහනය තැනකින් තැනකට යන ගතිය තිබෙන්නේ රෝද වලයි. රෝද කරකැවෙන හින්දයි තැනකින් තැනකට යන්නේ. ඒ රෝද කරකවන ගතිය වාහනය ඇතුලේ තිබෙන එක වෙන කථාවක්. නමුත් රෝද වලින් තමයි මේක එහා පැත්තට යන්නේ. වාහනයක රෝද ටික ගලවලා තිබුණොත් වාහනයට යන්න බෑ. ඒක නිසා මේ රෝද වල තිබෙනවා seat ටිකත් අරගෙන වාහනයේ වහලත් එක්කාසු කරගෙන තවත් තිබෙන දේවල් ඔක්කෝම අරගෙන තවත් තැනකට වාහනය ඇදගෙන යන්න පුළුවන් ගතිය. පහසුවෙන් යන්න පුළුවන් ගතියක් ඒකෙ තිබෙනවා. රෝදය කැරකෙන එකයි එතැන කෙරෙන්නේ. රෝදයේ කැරකීම එතැන කරනකොටම වාහනය ඉස්සරහට ගිහිල්ලා. ආයේ අමුතු දෙයක් කරන්න නෑ. ඔන්න ඔය වගේ මේ කියන්නා වූ තැනකින් තැනකට ගෙනියන්න පුළුවන් ශක්තිය හයිය තිබෙන ධර්මතා ටික තිබෙන්නේ වෙන කොහේවත්ම නොවෙයි චිත්ත ගති වලයි.

අපි බලමු ඒ චිත්ත ගති හෙවත් චෛතසික ධර්ම ටික මොනවාද කියලා. සම්මා දිට්ඨිය කියලා චෛතසිකයක් තිබෙනවා. සම්මා දිට්ඨිය කියන්නේ ප්‍රඥාව කියන කුසල චෛතසිකයයි. සම්මා සංකප්පය හැටියට අපි කථා කරන්නේ කුසල සිත්වල තිබෙන විතක්ක චෛතසිකයයි. සම්මා වාචාව කියලා කියන්නේ විරති චෛතසිකයයි. සම්මා කම්මන්ත කියන්නේ ඒත් විරති චෛතසිකයයි. සම්මා ආජීව කියලා කියන්නේ ආජීවය සිද්ධ කරන විරති චෛතසිකයයි. ඊළඟට සම්මා වායාම කියලා කියන්නේ පිං හිත්වල පහළ වෙන වීර්ය චෛතසිකයයි. සම්මා සතිය කියලා කියන්නේ කුසල් සිත් වල පහළ වෙන සති චෛතසිකයයි. සම්මා සමාධි කියලා කථා කරන්නේ කුසල් සිත් වල තිබෙන එකග්ගතා චෛතසිකයයි. එතකොට මෙතැන ඔක්කොම තිබෙනවා චෛතසික 8 = ප්‍රඥාව + විතක්කය + විරති 3 + වීරිය + සතිය + ඒකග්ගතා. මේ කිව්වේ සම්මා පැත්තට. මේ චෛතසික 8 සිත් නොවෙයි. මේ චෛතසික 8 රූපත් නොවෙයි. මේ චෛතසික 8 නිර්වාණ ධාතුවට සම්බන්ධයකුත් නෑ. මේ ටික චෛතසික 8 ක් පමණයි.

තවත් තිබෙනවා අකුසල පැත්තේ. ඒ තමයි මිච්ඡා දිට්ඨි. මිච්ඡා දිට්ඨි කියන්නේ දිට්ඨි චෛතසිකය. ඊළඟට තිබෙනවා මිච්ඡා සංකප්ප, නැවත වතාවක් විතක්ක චෛතසිකය ගැන කියවෙනවා. ඊළඟට මිච්ඡා වායාම, නැවත වතාවක් වීර්ය ගැන කියවෙනවා. මිච්ඡා සමාධි, නැවත වතාවක් ඒකග්ගතාවය ගැන කියනවා. දැන් මෙතැන චෛතසික වශයෙන් ගත්තට පස්සේ ඔක්කොම තිබෙන්නේ චෛතසික ධර්ම 9 යි. විතක්කය වීරිය එකග්ගතාවය කියන එක දෙපාරක් කියවෙනවා. ඒක නිසා ඒ ටික අපි ධර්ම හැටියට ගන්නවා කුසල පැත්තෙත් සහ අකුසල පැත්තෙත්. චෛතසික වශයෙන් තිබෙන්නේ 9 යයි.

ඇයි මේ විතක්කය වීර්ය නැවත ගත්තේ? අකුසල පැත්තට ගිහිල්ලා වැඩ කරන වෙලාවට විතක්කය, මිච්ඡා සංකප්පය වෙනවා. දිට්ඨිය, මිච්ඡා දට්ඨිය වෙනවා. වීරිය, මිච්ඡා වායාම වෙනවා. එකග්ගතාවය, මිච්ඡා සමාධිය වෙනවා. ඔන්න ඔය විදියට තමයි ඕක වෙන්නේ. මේ කියන්නා වූ ධර්ම චෛතසික වශයෙන් 9 ක් උනාට කුසල් අකුසල් වශයෙන් දෙපැත්තේම වැඩ කරන ධර්ම හැටියට 12 වෙනවා. ඔය ධර්ම වල තිබෙනවා මෙතැන තිබෙන්නා වූ නාම රූප පොදිය තව තැනකට ගිහිල්ලා පහළ කරන්න පුළුවන් හැකියාව, තව තැනකට යොමු කරන ගතිය.

උදාහරණයක් හැටියට අපේ මේ පින්වතුන් ඉන්න ඉන්න තැන් වලම ඉඳගෙන දැන් බණ අහනවා කියන වැඩේ කරනවා. මේ බණ අහන කෙනා සම්මුති වශයෙන් එකයි, පරමාර්ථ වශයෙන් එකයි. සම්මුති

වශයෙන් කථා කරනකොට මෙතැන බණ අහන්නෙක් ඉන්නවා. ස්ත්‍රියක් හරි පුරුෂයෙක් හරි දරුවෙක් හරි බණ අහන කෙනෙක් ඉන්නවා. එතකොට ඉන්න තැන ගෙදරකුත් ඉන්නවා. ඒවා සම්මුති වචන. ඉඳගෙන ඉන්න පුටුවකුත් තිබෙනවා. පුටුව කියන්නේ සම්මුති ව්‍යවහාරික වචනයක්. 'මම බණ අහනවා' කියලා මම කියන සම්මුති වචනයකුත් එක්කාසු කරගන්නවා. මම කියන සම්මුති සත්‍යයේ තිබෙන්නා වූ ඔය ටික අපි පරමාර්ථයට බැහැලා සලකා බැලුවොත් තිබෙන්නේ රූප 28 න් රූප 27ක්. භාව රූප දෙකෙන් එක්කෙනෙකුට එක භාවරූපයයි තිබෙන්නේ. ඔය හැම එකෙනාගේම ජීවිතියේ හිසෙන් පටන්ගන්න කෙස් රෝදේ ඉඳලා යටිපතුලේ තිබෙන්නා වූ හම් කැල්ල දක්වා මේ හැම තැනම තිබෙන්නේ රූප ධර්ම මිටියක්. පඨවි - ආපෝ - තේජෝ - වායෝ - වර්ණ - ගන්ධ - රස - ඕජා - ජීවිත ඉන්ද්‍රිය - ආකාස ධාතු - භාව රූපය - චක්ඛු - සෝත - ඝාණ - ජිව්හා - කාය - වත්ථු වගේ තිබෙන්නා වූ මිටියක් තමයි රූප වශයෙන් තිබෙන්නේ. ඔය රූප මිටිය අස්සේ රූප ස්වභාවයන්ගෙන් වෙන් වෙච්ච චිත්ත චෛතසික පොදියක් තිබෙනවා. දැන් මේ චිත්ත - චෛතසික - රූප කියන ධර්ම එක්කාසුවක් බණ අහනවා කියන වැඩේ ක්‍රියාත්මක කරනවා. සත්වයෙක් කෙනෙක් කියලා කියන්නේ ඔය ධර්ම පිණ්ඩයට. ඔය කියපු ධර්ම වල එක එක සිත් වලටයි චෛතසික වලටයි රූප වලටයි ආවේනික වෙනමම වෙනමම ගති ස්වභාව වෙනම ලක්ෂණ තිබෙනවා. ඒ වෙනම ලක්ෂණ - වෙනම ගති - වෙනම හැඩ - වෙනම බල - වෙනම ප්‍රත්‍යය ශක්තිය තිබෙන මහා විශාල ධර්ම පොදියක් තමයි ඔය එක්කාසු වෙලා තිබෙන්නේ. ඕක දැන් මේ වෙලාවට මනුස්සලෝකය කියන තැනට වැටිලා මනුස්සයෙක් හැටියට කථා කරමින් තිබෙනවා. දැන් බණ අහනවා. මේ ක්‍රියාත්මක වෙන චිත්තය - මේ රූපය - මේ චෛතසික ටික මෙතැනින් අයින් කරලා මෙතැන වැඩ කරන එක නවත්වලා මේ පොදිය ඈත තිබෙන්නාවූ අපිට පේන්නෙ නැති ඒ වාගේම අපිට හිතා ගන්නත් බැරි ඈත තැනකට, උඩ තිබෙන දිව්‍යලෝකයකට ගිහිල්ලා එතැන පහළ කරන්න, එතැනට අරගෙන යන්න පුළුවන් ගතියක් මේ තිබෙන්නා වූ ධර්ම මණ්ඩලය අස්සේ තිබෙන සමහර ධර්ම වලට තිබෙනවා. ඒ තමයි මේ කියපු මාර්ග ධර්ම. බලන්න, ඒ තරම් ඈතකට අදින්න පුළුවන්, තල්ලු කරන්න පුළුවන්, ගෙනියන්න පුළුවන් ගතියක් මේවට හිමියි.

අනිත් පැත්තට ගත්තොත් මෙතැන මේ ක්‍රියාත්මක වෙන, ලස්සන, පහසුවෙන් තිබෙන ධර්ම කොටස, මේ චිත්ත චෛතසික රූප ටික මෙතැනින් අතුරුදහන් කරවලා මෙතැනින් සම්පූර්ණයෙන්ම අයින් කරවලා අපායට ගිහිල්ලා කොහේ හරි තැනක පහත ගින්දර තිබෙන තැනකට කළුවර අන්ධකාර තැනකට වේදනාවෙන් කකියන තැනකට දාන්න පුළුවන් ගතියකුත් ඔය අස්සේ තිබෙනවා. ඒක නිසා මේ බණ අහන අයගේ ජීවිත අස්සේ තිබෙන දැන් කියපු මිච්ඡා දිට්ඨී - මිච්ඡා සංකප්ප - මිච්ඡා සමාධි වශයෙන් ඔය කියපු ඒවත් 'සම්මා' වශයෙන් කියපු ඒවත් එක තැනක තිබෙනවා. ඒක නිසා දපැත්තටම ඇදගෙන යන්න පුළුවන් ඒවා තිබෙනවා. සමහර ඒවා මෙහෙ දාල යනවා. සමහර ඒවා දාල ගියත් වෙන තැනක හදාගන්න පුළුවන් ශක්තිය අරගෙන යනවා. ඔන්න ඔය විදියට තමයි මේ ටික ක්‍රියාත්මක වෙන්නේ.

දැන් මේ කියලා දුන්නේ ජීවිත අස්සේ තිබෙන රහස්‍යම වගේ දේවල්. බුදුරජාණන්වහන්සේගේ ධර්ම කථනය බුදුරජාණන්වහන්සේගේ ධර්ම පැහැදිලි කිරීම හරී පිරිසිදුයි, අඩු නෑ. හොඳට කියලා දෙනවා. ඒ උනාට මේ ධර්ම වල තිබෙන සියුම් කම නිසාම මේ ධර්ම වලට ආවේනික අමුතු පුංචි ඒ ගති ගුණ ලක්ෂණ නිසා සාමාන්‍ය කෙනෙකුට මේ වගේ ස්ථානයකට ගිහිල්ලා නුවණින් ස්පර්ශ කරලා තේරුම් ගන්න අමාරු ගතියක් තිබෙනවා. අපි මේ දේශනාවකින් කරන්නෙත් මේවා තේරුම් ගන්න උත්සාහ කරන මේ පිංවතුන්ගේ හිත් වලට මහා විසාල ධර්ම කොටසකින් පොඩ්ඩ පොඩ්ඩ අරගෙන අරගෙන, තථාගතයන් වහන්සේගේ ධර්ම වලින් පොඩ්ඩ පොඩ්ඩ අරගෙන මේ පිංවතුන්ගේ සිත් වල පිරිමද්දවන ස්පර්ශ කරවන එක.

ඇත්තටම කියනවානම් හොඳ ප්‍රණීත ආහාරයක් පුංචි දරුවෙකුට කවනකොට අම්මලා පුංචි තේ හැන්දක අග්ගිස්සට පොඩ්ඩක් අරගෙන දරුවාගේ තොල්වල ස්පර්ශ කරවනවා අපි සමහර තැන්වලදී දැකලා තිබෙනවා. ඒ ඩිංග ඒ පොඩි දරුවා කනවා. බොහොම පොඩ්ඩයි. කොච්චර භාජනයේ ආහාර තිබුණත් කොච්චර හැන්ද ලොකුවට ගත්තත් දරුවෙකුට කටේ තොලේ ගෑවෙන්න ගන්නේ පොඩි ටිකයි. මේ අනන්ත විශ්වයේ තිබෙන ධර්ම අරගෙන මේ විදියට පට්ඨානයට එක්කාසු කරලා දේශනා කරපු මේ

ධර්ම විග්‍රහයේ අතිශය පුංචි පොඩ්ඩක් තමයි මේ පින්වතුන්ගේ හිත් වල අපි තවරන්නේ. ඉතින් මේ පිංවතුන් ඒකෙ තිබෙන රස එතැනට ගිහිල්ලා නුවණින් දැකලම ඕනෑ අවබෝධ කරගන්න. එතකොට රස තේරේවි, අර දරුවෝ පුංචි ඩිංගක් කනවා වගේ. ඊට පස්සේ මේකට බැහැ ගන්න හිත යෙදේවි. මෙතෙක් මා කිව්වේ මේ ධර්ම ගොඩේ තිබෙන්නා වූ කොටසක්. තව මේකේ බෙදුම් තිබෙනවා, හේතු අහේතු වශයෙන්. ඉස්සෙල්ලත් ඒවා කියලා දීල තිබෙන නිසා අපි ඒවාට යන්නේ නැතුව අපි යමු මාර්ග ප්‍රත්‍යය ධර්ම වශයෙන් අරගෙන බලන්න.

මාර්ග ප්‍රත්‍යය යටතේ වීථිවාර දක්වලා තිබෙනවා 7 ක්. මේ වීථිවාර 7 හරහා අපි තේරුම් ගනිමු කොහොමද මේක වෙන්නේ කියලා. මේක ගොඩවල් තුනකට බෙදනවා. කුසල ධර්ම හැටියට මාර්ග ප්‍රත්‍යය ශක්තිය තිබෙන ධර්ම කථා කරන්නේ කොහොමද, අකුසල ධර්ම හැටියට මාර්ග ප්‍රත්‍යය ශක්තිය තිබෙන ධර්ම කථා කරන්නේ කොහොමද, අව්‍යාකෘත ධර්ම හැටියට මාර්ග ප්‍රත්‍යය ශක්තිය තිබෙන ධර්ම කථා කරන්නේ කොහොමද කියලා තිබෙනවා. අපි ඒක දැන් බලමු.

1) වෙනි වීථි වාරය

**කුසලො ධම්මො කුසලස්ස ධම්මස්ස මග්ගපච්චයෙන පච්චයො – කුසලානි මග්ගඞ්ගානි සම්පයුත්තකානං ඛන්ධානං මග්ගපච්චයෙන පච්චයො.**

**කුසලො ධම්මො කුසලස්ස ධම්මස්ස මග්ගපච්චයෙන පච්චයො** = කුසල ධර්මයක් තවත් කුසල ධර්මයකට මාර්ග ප්‍රත්‍යය ශක්තියෙන් උපකාර වෙනවා.

මාර්ග ශක්තිය හැටියට තිබෙන්නා වූ කුසල ධර්මයක් තවත් ඒ වර්ගයේම කුසල ධර්මයකටමයි උපකාර වෙන්නේ. කවදාකවත් කුසල ධර්මයක් අකුසල ධර්මයකට මාර්ග ප්‍රත්‍යය කරන්නේ නෑ. ඒ කියන්නේ හොඳ දෙයක් කරනවා නරක විපාකයක් හම්බවෙනවා කියලා දෙයක් වෙන්නේ නෑ. නරක දෙයක් කරලා හොඳ දෙයක් හම්බවෙනවා කියලා දෙයක් වෙන්නේ නෑ. හොඳ දෙයක් කළොත් හොඳ දේ හම්බ වෙනවා. නරක දේ කළොත් නරක දේ හම්බවෙනවා. ඒ තමයි සමාන්‍යයෙන් ලෝක ව්‍යවහාර කථනය. ධර්මයට ගියාට පස්සේ කුසල ධර්මයකින් නිෂ්පාදනය කරන්නේ කුසල ධර්මයක්මයි. අකුසල ධර්මයකින් නිෂ්පාදනය කරන්නේ අකුසල ධර්මයක්මයි. ප්‍රත්‍යය වෙන්නේ ඒ විදියටයි, ඒ ශක්තිය තිබෙන නිසා.

කුසල ධර්ම හැටියට අපි දැනගත්තා සිත් 21කක්. ඒ තමයි සෝභන සිත් 8 + රූපාවචර සිත් 5 + අරූපාවචර සිත් 4 + ලෝකෝත්තර මාර්ග සිත් 4 = 21. මේ සිත් 21 ඇතුලත තිබෙනවා ධර්ම ගොඩක්. හිත කියන්නේ එකක් චෛතසික කියන්නේ තවත් එකක්. මෙතැන ගත්තේ සිත් වශයෙන්, චිත්ත මණ්ඩල 21 හැටියට. මේ සිත්වල ඇතුලත තිබෙන චෛතසික වල තමයි ඔය සිත සහ අනිත් ඒවා මෙහෙයවන අරගෙන යන තව තැනකට පමුණුවන ශක්තිය තිබෙන්නේ. සිත් 21 සහ ඒ හා සමග ක්‍රියාත්මක වෙන චෛතසික 38 ක් තිබෙනවා. ඔය ටික තමයි වැඩ කරන්නේ.

දැන් අපි බලමු මේක වැඩ කරන විදිය. මනුස්සයෙක් දානමය පිංකමක් කරනවා. දානයක් දෙන වෙලාවේදී එයාට පහළ වෙනවා **සෝමනස්ස සහගත ඥාන සම්පයුත්ත අසංඛාරික සිත**. මේ සෝමනස්ස සහගත ඥාන සම්පයුත්ත සිතේ ඔක්කෝම මාර්ග ධර්ම වැඩ කරන්නේ නෑ. මාර්ග ශක්තිය තිබෙන චෛතසික ටිකක් තිබෙනවා. ඒ තමයි **ප්‍රඥා** චෛතසිකය. ඊළඟට **විතක්කය** කියන චෛතසිකය. **සම්මා කම්මන්ත** කියන චෛතසිකය තිබෙනවා. **විරිය** චෛතසිකය තිබෙනවා, **සති** චෛතසික තිබෙනවා, **එකග්ගතා** චෛතසික තිබෙනවා. දානය සම්බන්ධයෙන් කථා කළොත් **සම්මා වාචා** වෙනවා. **සම්මා ආජීවය** තිබෙනවා. මේ ටික අඩු වශයෙන් හෝ වැඩි වශයෙන් එකතු වෙනවා. සම්මා වාචා තිබෙනකොට සම්මා කම්මන්ත නෑ, ඒ වගේ අඩුවැඩි වෙනවා. නමුත් බොහෝ දේවල් තිබෙනවා. දානය දෙන වෙලාවේදී සම්මා කම්මන්තය මුල් වෙනවා. දානය පූජා කරනකොට කුසල ධර්ම පොදියක් ඔතැන වැඩ කරනවා. සියුම් චිත්ත චෛතසික ධර්ම පොදියක් එක රංචුවකට වැඩ කරන්නේ. ඒකට තමයි කියන්නේ **සෝමනස්ස සහගත ඥාන සම්පයුත්ත අසංඛාරික සිත** කියලා. ඒ සිත පහළ උනහම එතැන තිබෙනවා දිව්‍යලෝකයට ගෙනියන්න, වෙනත් හොඳ තැනකට පමුණුවන්න ඇදගෙන යන ගතියක්. ඔය

**ප්‍රඥාව - සම්මා කම්මන්ත - සම්මා වාචා - සම්මා ආජීව - විතක්කය - සම්මා සතිය - විරිය - එකග්ගතාවය** කියන මේ චෛතසික ඒවත් එක්ක පහළ වෙච්ච අනිත් චෛතසික ධර්ම සහ සිතත් එක්කාසු කරගෙන තව තැනකට පමුණුවන, ඇදගෙන යන, තව තැනක පහළ වෙන්න මහා ආනුභාව ගතියක් හදන 'එතැනට යමු' කියන්නා වගේ පෙන්නුම් කරන, හැඩ ගස්සන, දුවන කෙනෙකුට ඉස්සරහට යන්න ශක්තිය දෙන්නා වගේ අමුතු ගතියක් මේවගේ තිබෙනවා. ඒක නිසා තමයි මෙතැන පහළ වෙලා බණ අහපු කෙනාගේ හිත තව අවුරුදු ගානකින් ඈත ඉහළ තැනක පහළ වෙන්නේ. එතැනට ගෙනියන්න පුළුවන් ගතියක් ඒ ධර්ම වල තිබෙනවා. දැන් අපිට තිබෙන්නේ තැනකින් තැනකට යන ප්‍රාර්ථනාව නොවෙයි. ඒක තම තමන්ගේ පෞද්ගලික කාරණාවක්, නමුත් ධර්ම විග්‍රය මේකයි. ධර්ම විග්‍රයට අනුව තැනින් තැනට ගෙනියන්නා වූ ගුණ ස්වභාව මේකේ තිබෙනවා. අන්න ඒක නිසා **කුසලො ධම්මො කුසලස්ස ධම්මස්ස මග්ගපච්චයෙන පච්චයො** කියලා කියනවා = කුසල ධර්මයක් කුසල ධර්මයකටම ප්‍රත්‍යය වෙනවා මාර්ග ප්‍රත්‍යයෙන්. එතකොට මේ මාර්ග ප්‍රත්‍යය තිබෙන ධර්ම තමයි විතක්ක - සම්මා වාචා - සම්මා කම්මන්ත - සම්මා ආජීව - ප්‍රඥාව - විරිය - සතිය - එකග්ගතාවය. මේ ධර්ම වල තමයි මාර්ග ප්‍රත්‍යය ශක්තිය තිබෙන්නේ. මේ ප්‍රත්‍යය ශක්තිය තිබෙන ධර්ම ඒවත් එක්ක ඉන්න අනිත් ධර්ම වලට උපකාර වෙනවා කුසලය කරන්න, මාර්ගය වඩන්න.

මම එක වෙලාවක වතුර ටිකක් දිහා බලාගෙන හිටියා. බිමට වතුර ටිකක් දැම්මහම ඒක බිංදුව වගේ හැදිලා හෙමිහිට නයෙක් වගේ ඉස්සරහට ඇදීගෙන යනවා. ඒ වතුර පාර උඩ තිබුණා දූවිලි වගේ වැටිලා. ඒ දූවිලි පෙගිලා යටට යන්නේ නැතුව වතුරේ උඩ තිබෙනවා. ඒ කුණු ටික දිහා හරියට බැලුවොත් සතෙකුගේ ඔළුව උඩ කන් දෙකක් වගේ මොකක් හරි දෙයක් තිබෙනවා වගෙයි පේන්නෙ. මේ වතුර ටික පොළොවේ ගලාගෙන යනකොට අර කුණු ටිකත් උඩින් යනවා යටට ගිලා බහින්නේ නැතුව. ඒවගේම මේ කියන මාර්ග ධර්ම ටික අනිත් ඒවාත් ඇදගෙන තමයි යන්නේ. අනිත් ඒවටත් 'අපි මේ ගමන යං' කියලා අඩ ගහගෙන යන ගතිය ඒ ධර්ම වල තිබෙනවා. දැන් හිතට කියන්න බෑ 'මම දිව්‍ය ලෝකයට යන්නේ නෑ' කියලා. ඒකට හේතුව 'සිත' තනිවෙන්නේ නෑ. මේ කියන්නා වූ මාර්ග ශක්තිය තිබෙන චෛතසික වලට තිබෙනවා අනිත් අයත් තමන්ගේ යටතට අරගෙන අනිත් අයටත් තමන්ගේ බලය විදහා පාගෙන ඒ අයත් ඇදගෙන යන්න පුළුවන් ගතිය. ඒක නිසා මේ ධර්ම වල තිබෙනවා මාර්ග ප්‍රත්‍යය ශක්තිය. මේක කථා කරනකොට කියනවා **කුසලානි මග්ගඞ්ගානි සම්පයුත්තකානං ඛන්ධානං මග්ගපච්චයෙන පච්චයො** කියලා = කුසල ධර්ම මාර්ග අංගයෝ ඒ කුසල සම්පයුත්ත ස්කන්ධයන්ට මාර්ග ප්‍රත්‍යයෙන් ප්‍රත්‍යය වෙනවා කියන එකයි මේ කියන්නේ ස්කන්ධ වශයෙන් ගත්තහම. චෛතසික වශයෙන් තමයි දැන් මම මේ පිංවතුන්ට විස්තර කළේ.

ඊළඟ වීථිය

2) වෙනි වීථි වාරය

**කුසලො ධම්මො අබ්‍යාකතස්ස ධම්මස්ස මග්ගපච්චයෙන පච්චයො – කුසලානි මග්ගඞ්ගානි චිත්තසමුට්ඨානානං රූපානං මග්ගපච්චයෙන පච්චයො.**

**කුසලො ධම්මො අබ්‍යාකතස්ස ධම්මස්ස මග්ගපච්චයෙන පච්චයො** = කුසල ධර්මයක් අව්‍යාකෘත ධර්මයකට මාර්ග ප්‍රත්‍යයෙන් ප්‍රත්‍යය වෙනවා.

අව්‍යාකෘත ධර්ම කියලා කියන්නේ විපාක ධර්මයි ක්‍රියා ධර්මයි රූප ධර්මයි. මේකෙන් කියන්නේ යම්කිසි වෙලාවක මනුස්සයාගේ හිතේ දානයක් දෙන්න ඕනෑ කියලා හිතක් පහළ උනහම ඒ දානය දෙන හිතට යටත් කරගන්නවා එයාගේ ඇඟ, අතපය. ඔන්න ඔය කියන්නා වූ මාර්ග ස්වභාවය තිබෙන සිත් පහළ වෙන නිසා තමයි ඔය දාන දෙන අය ඒ දානමය හිතේ තිබෙන මාර්ග වල පොළොඹවන ගතිය නිසා ඒ බලය ඇඟට වැදිලා භාජන අරගෙන ස්වාමීන්වහන්සේලා ගාවට ඒ ශරීරය තල්ලුකරගෙන යන්නේ, දානය බෙදවන්නේ සහ බෙදන ආකාරයේ රූප හදන්නේ. ඒක නිසා **කුසලො ධම්මො අබ්‍යාකතස්ස ධම්මස්ස මග්ගපච්චයෙන පච්චයො** කියන තැන අබ්‍යාකත ධර්ම තමයි **චිත්තජ රූප**. ඒ චිත්තජ රූප ටික පහළ

වෙනවා කුසල් සිතට යටත්ව. නමුත් කුසල් සිත් වෙනයි, චිත්තජ රූප වෙනයි. කුසල් සිත් සහ ඒ ධර්ම කුසල් නමුත් රූපයන්ට කියන්නේ නෑ කුසල රූපයෝ කියලා. ඒවාට කියන්නේ අව්‍යාකෘත ධර්ම කියලා. අව්‍යාකෘත ධර්මයන්ට බලපානවා සිත සහ මාර්ග ධර්ම. මාර්ග ධර්ම සිතත් යටකරගෙන රූපත් හදාගෙන එනවා. ඒක නිසා කියනවා **කුසලො ධම්මො අබ්‍යාකතස්ස ධම්මස්ස මග්ගපච්චයෙන පච්චයො** කියලා.

ඒකෙ හරි අමුතු ගතියක් තිබෙනවා. ඒ තමයි යම්කිසි කෙනෙක් වැන්දොත් එයාට වැඳුම් හම්බ වෙනවා. ඒ කියන්නේ වැඳුම් ලබාදෙන්න හදපු හිතේ තිබෙනවා වැඳුම් ලබන්න මාර්ගයක් හදලා දෙන ගතිය. වැඳුම් ලබාදෙන කොට තමන්ට වැඳුම් ලැබෙන මාර්ගයක් ඒ සිතේ හදනවා. ඕක බුදුරජාණන් වහන්සේ උන්වහන්සේගේ ඒ සර්වඥතාඥානයෙන් හොඳටම ස්පර්ශ කරලා දැක්කා. මේකේ රහස් නෑ. යම්කිසි දෙයක් රහසක් වෙන්නේ යම්කිසි දෙයක් ගුප්තයක් වෙන්නේ ඒක නොදැනගෙන ඉන්න තාක් කල් විතරයි. ඒක දැන ගත්ත දවසට ගුප්ත ගතිය නෑ. දැන ගත්ත දවසට රහස් භාවය නෑ. ඒක නිසා මේ ධර්ම හරිම බලවත් විදියට ඒ ධර්ම වල තිබෙන ගුණ හංගගෙන වගේ තිබෙන්නේ. නමුත් ඥානයට ඔය ඔක්කෝම යටත් වෙනවා. ඒක නිසා අද මම මේ පිංවතුන්ට මේ කියන කථාව මේ කාරණා දෙකෙන් නවත්වනවා. මේකේ ඉතිරි කොටස මම ඊළඟ අවස්ථාවේදී අරගන්නවා. මේ මාර්ගය කියන එක තේරුම් ගන්නේ නැතුව ප්‍රත්‍යය ගුණය තේරුම් ගන්නේ නැතුව ඒවා තිබෙන තැන් තේරුම් ගන්නේ නැතුව ඉතා ඉක්මනට කථනය හමාර කරන්න ගියාට හිතට වැදෙන ස්පර්ශ වෙන ධර්ම කාණ්ඩයක් නැතිවෙනවා. ඒක නිසා තමයි මේ පින්වතුන්ට මම මේ ටික කියලා දුන්නේ මෙච්චර වේලාවක් අරගෙන.

අද හොඳ වටිනා දවසක්. ඇසල පුර පසළොස්වක පොහොය දවස නිමා වෙච්ච ගමන්ම ස්වාමීන්වහන්සේලා වස් සමාදන් වෙලා ප්‍රතිපත්ති ගමන ආරම්භ කරපු දවසක්. ඊයේ තමයි වස් සමාදන් උනේ. ඉතින් අද මේ දෙවෙනි දවස. මේ පින්වත් සැමදෙනාම සතුටු වෙන්න වස් කාලයේ ඉස්සරවෙලාම කියලා මේ පිංවතුන් බුදුරජාණන්වහන්සේගේ නුවණේ ස්පර්ශ ලබාගෙන නුවණේ තිබෙන්නා වූ එළිය වැදිලා ඒ එළියට අහුවෙලා ප්‍රඥා ආලෝකයෙන් මතුකරගෙන විවර කරලා රහස් හැටියට තිබ්ච්ච දේවල් ලෝකයාට විසිරුවලා මේක ලෝකයට ඉදිරිපත් කළා, මතුකර ගත්තා. ඒ ධර්ම කාණ්ඩයේ එක මුල්ලක තිබෙන කාණ්ඩයක් පමණයි, බොහෝම පොඩ්ඩයි අද මේ කිව්වේ. මේකේ ගැඹුරට යන්න යන්න හරිම ලස්සනයි ප්‍රණීතයි ශාන්තයි.

එක තැනක විද්‍යාඥයෝ පිරිසක් මුහුදේ පතුලට කැමරාවක් යවල ලයිට් එකක් ගහලා බලනවා මුහුදේ පතුලේ ඉන්නා වූ සත්තු කවුද, මොන හැඩද, මොන විදියද, පරිසරය මොන වගේද කියලා. ඉතින් ඒ කැමරාව මුහුදේ පතුලටම යවනවා. ලයිට් එකේ තිබෙන එළියෙන් කැමරාවෙන් මේ අය බලාගන්නවා ඒ දේවල්. ඔය වගේ රහස් හැටියට නොපෙනී තිබෙන යට ගිහිල්ලා තිබෙන මහා පතුලක කිඳා බැහැලා තිබෙන ධර්ම ලොව්තුරා බුදුරජාණන් වහන්සේගේ නුවණින් ගැඹුරටම ගිහිල්ලා පතුලටම ගිහිල්ලා නුවණේ ආලෝකය යොදලා ඒවා තිබෙන විදිය හැඩවෙන විදිය පවතින විදිය ලක්ෂණ ආකාර ඔක්කෝම මතුකරලා දේශනා කළා. ඉතින් අපි බොහෝම සන්තෝස වෙන්න ඕනෑ බුදුරජාණන්වහන්සේ දේශනා කළ මේ චෛතසික ධර්මයන්ගේ තිබෙන මාර්ග ගුණ ගතිය හැම තැනමත් නෑ. සමහර ධර්ම වලට විතරයි ඒවා තිබෙන්නේ. සමහර ධර්ම වලට විතරක් මාර්ග ගුණ ගතිය තිබුණාට ඒ ධර්මවල බලයෙන් ඒවත් එක්ක හැසිරෙන ගැවසෙන අනිත් ධර්ම වලටත් ඒ ධර්ම වල ආනුභාවයට යටත්ව තව තැනකට යාගන්න පුළුවන් බවකුත් ඒකෙ තිබෙනවා කියලා තේරුම් අරගෙන බුදුරජාණන්වහන්සේ අපිට දේශනා කළා.

මේ වීථිවාර හතෙන් වීථිවාර දෙකක් විතරයි මම මේ පින්වතුන්ට කියලා දුන්නේ. ඉතිරි කොටස ඉදිරියේදී අපි මේ පින්වතුන්ට පැහැදිලිව කියලා දෙනවා. ඒ නිසා මෙතෙක් මේ ධර්මය හිත හිතා මෙනෙහි කර කර සත්ව පුද්ගල ආත්ම සංඥාවෙන් තොරව ධර්ම සංඥාවන් පමණක් මතුකරගෙන මෙනෙහි කිරීමෙන් උපදවාගත්ත සියලුම කුසල ධර්මයන්ගේ බලයෙන් ශක්තියෙන් සැම දෙනාටම චතුරාර්ය සත්‍යය ධර්මයන් හොඳට අවබෝධ කරගෙන අමාමහ නිර්වාණ ධාතුවෙන් සැනසෙන්න නිවනින් නිවී යන්න ලැබේවා කියලා ප්‍රාර්ථනා කරනවා. මේ ධර්ම මනසිකාරය ඒකාන්තයෙන්ම හේතු වෙනවා උපකාර වෙනවා මේ මාර්ග ධර්ම නැති තැනකට යන්න. මාර්ග ධර්ම නැති මාර්ග ගති නැති තැන තමයි නිර්වාණ ධාතුව. නිර්වාණ ධාතුවේ මාර්ගමය ගුණයක් නෑ. චෛතසික වල විතරයි මාර්ග ගුණය තිබෙන්නේ. නිර්වාණ

ධාතුවේ චිත්ත ක්‍රියාකාරිත්වයක් නෑ. නිර්වාණ ධාතුවේ චෛතසික ක්‍රියාකාරිත්වයක් නෑ. නිර්වාණ ධාතුවේ මහාභූත ක්‍රියාකාරිත්වයක් නෑ. නිර්වාණ ධාතුවේ සූක්ෂම රූප ක්‍රියාකාරීත්වයකුත් නෑ. නිර්වාණ ධාතුව හේතුවක් ඵලයක් හැටියට ක්‍රියාත්මක වෙන කිසිම දෙයක් නැති ශාන්ත වූ මනෝඥ වූ අති මදුර වූ ඉතාම රසවත් වූ පවිවේක වූ හරිම සියුම් වෙච්ච ධර්ම ස්වභාවයක්. ඒ උතුම් ධර්මය සැම දෙනාටම මේ මනසිකාරයෙන් බණ ඇසීමෙන් නුවණින් ස්පර්ශ කරගෙන නුවණින්ම ඒ ස්ථානයට වැදී නිවනින් සැනසෙන්න ලැබේවා කියලා මෛත්‍රීයෙන් ප්‍රාර්ථනා කරනවා, ආශිර්වාද කරනවා. සැම දෙනාටම තෙරුවන් සරණයි!

හොඳයි පින්වත්නි මේ වෙලාවේ නැවතත් අපි කල්‍යාණ මිත්‍ර හිතක් හදාගෙන කෘතවේදී ශීර්ෂය සිතට අවධිකරගෙන මේ වැඩ සටහනේ පිංවතුන්ට පිං අනුමෝදන් කරමු. පින්වත් ලලිත් දළුවත්ත මහත්මයා සිහිපත් කරන්න ඕනෑ. ලලිත් දළුවත්ත මහත්මයාගේ විසාල උත්සාහයක් නිසා තමයි මේ ලෝකවාසී විසාල පිරිසකට මේ බණ අහන්න අවස්ථාව සැලසිලා තිබෙන්නේ. සමහර වෙලාවට මේ දාන බණ නිසා කොහෙන් හරි තැනකින් එක්කෝ කාගෙන් හරි ඉල්ලාගෙන හරි internet ඒකෙන් බලාගෙන හරි අපේ දුරකථන වලට මිනිස්සු කථා කරලා ප්‍රශ්න අහනවා, ලියා ගත්තා කියලා කියනවා. ඒ ගොල්ලෝ ලෝකයේ එක එක තැන් වල ඉඳලා මේවා අහනවා. ඇත්තවශයෙන්ම ඒ අය තව තේරුම් ගන්නයි ප්‍රශ්න අහන්නේ. ඉතින් මේ පිංවතුන් මේ එක්කාසු කරලා තැන්පත් කරවන අහන්න සලස්වන බණ නිසයි ඒ. ඉතින් අපි මේ පිංවතුන් කෙරෙහි ප්‍රසාද සිතක් ඇතිකර ගන්නවා සහ ප්‍රශංසා කරනවා.

ලලිත් දළුවත්ත මහත්මයා ජයන්ත මහත්මයා අපේ පින්වත් මේ ධර්ම මණ්ඩලය එක්කාසුවෙලා මේක කරන නිසා අපි දේශනා කරනවා. ඒවගේම තමයි මෙතැන නැති විසාල පිරිසකුත් අහනවා කියලා අපිට දැනෙන්නේ ඊමේල් ටෙලිෆෝන් පණිවිඩ එනකොටයි. ඉතින් ඒක ලෝක ධර්ම සේවාවක් වෙනවා. නැත්නම් අපි මේ පින්වතුන් මුල් කරගෙන දේශනා කරලා අවසන් කරනවා. ඒක නිසා මේ ලලිත් දළුවත්ත මහත්මයාගේ උත්සාහය කැප වීම සහ පවත්වාගෙන යෑම, ජයන්ත මහත්මයාගේ ඒ සහ සම්බන්ධ කරගැනීමේ කටයුතු හරිම වටිනවා. ඒක නිසා මේ පින්වත් සැම දෙනාටම සැනසිල්ලක් වේවා! ලලිත් මහත්මයාටත් නිදුක් නිරෝගී චිර ජීවනය සැලසේවා! කරදර අපල උපද්‍රව සියල්ල දුරුකරගෙන යහපත් නිරෝගිමත් ජීවිතයක් පවත්වාගෙන ධර්ම මාර්ගයේ යා ගන්න ලැබේවා! ඒ පවුලේ සැම දෙනාටම ශාන්තියක් වේවා! අපේ මේ දහම් මණ්ඩලයේ ඉන්න හිතන මෙනෙහි කරන සැම සියලු දෙනාටම මේ අති ගාම්භීර වූ ධර්ම වල ආනුභාව බලයෙන් ඒ ධර්මය අවබෝධ කරගත් තථාගත සම්මා සම්බුදු පියාණන්වහන්සේගේ ආනුභාව බලයෙන් ධර්ම රත්නයේ සංඝ රත්නයේ ආනුභාව බලයෙන් සැනසිල්ලක්ම වේවා! ධර්මයෙන් සැනසි සැනසී මේවා භාර අවුස්සා බල බලා මෙනෙහි කර කර නුවණින් දැක දැක ඒකාන්තයෙන්ම ඒ ශාන්ත වූ නිර්වාණ ධාතුවට යාගන්න ලැබේවා! නිවනින් සැනසෙන්න මේ පින හේතු වාසනා වේවා කියලා මෛත්‍රීයෙන් ආශිර්වාද කරනවා ප්‍රාර්ථනා කරනවා. සැම දෙනාටම යහපතක් වේවා! තෙරුවන් සරණයි!

සාධු! සාධු! සාධු!

සීලවන්තං ගුණවන්තං - පුඤ්ඤක්ඛෙත්තං අනුත්තරං
දුල්ලබෙන මයා ලද්ධං - පස්සිතුං වන්දිතුං වරං
සාරිපුත්තාදි ථෙරානං - ආගතං පටිපටියා
සද්ධා සීලං දයා වාසං - බුද්ධ පුත්තං නමා මහං